# ටෙන්ඩර් දැන්වීමයි

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

# බෙලිහුල්ඔය දියපහස ගිමන්හල බදු දීම

# 2023/2024/2025 වර්ෂ සඳහා

01. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන බෙලිහුල්ඔය දියපහස ගිමන්හල 2023/08/29 දින සිට දීර්ඝ කාලින බදු දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත් 2023/09/20 දින පෙ.ව.9.30 දක්වා භාර ගනු ලැබේ.
    - ටෙන්ඩර්පත් ආකෘති පත් නිකුත් කිරීම - 2023/08/29 දින සිට 2023/09/20 දින පෙ.ව.9.00 දක්වා
    - ටෙන්ඩර්පත් භාර ගැනීම - 2023/09/20 දින පෙ.ව.9.30 දක්වා
    - ටෙන්ඩර්පත් විවෘත කිරීම - 2023/09/20 දින පෙ.ව.10.00ට

02. උපලේඛනයේ සඳහන් ගාස්තු, මුදලින් ගෙවූ පසු මෙම කාර්යාලයෙන් ටෙන්ඩර්පත් ආකෘති ලබා ගත හැක. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් 2023/09/20 දින පෙ.ව 9.30 ට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ අතේ ගෙනවිත් මෙම කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක.

## ටෙන්ඩර් කොන්දේසි

01. ටෙන්ඩර්පත් අයදුම්පත් ලබා ගැනීමේදි අයදුම්කරුවන් තමාගේ අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

02. 2023/09/20 දින පෙ.ව 9.30 ට පෙර විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්වල මුල් පිටපත් හා අනු පිටපත් වෙන වෙනම කවරවල බහා කවරයේ වම්පස ඉහල කෙළවරේ මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර එම කවර දෙකම එකම කවරයක බහා ලේකම්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව, මොරහැල, බලංගොඩ ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිම කල හැක. එම කවරයේ වම්පස ඉහල කෙළවරේ **දියපහස ගිමන්හල බදුදීම 2023/2024/2025** යනුවෙන් සඳහන් කළ යුතුය.

03. බදුකරු විසින් ගෙවිය යුතු මුදල සමාන වාරික **36** කින් ගෙවිය යුතු අතර වාරික 03කට සමාන මුදලක් ඇප මුදලක් ලෙස සභාවේ තැන්පත් කල යුතුය. නැතහොත් සම්පූර්ණ ලංසු මුදල එකවර ගෙවා ගිවිසුම් අත්සන් කළ හැකිය. උපරිම ලංසු මුදල ලංසු වශයෙන් තබා ඇති ලංසුකරුට ප්‍රමුඛතාවය ලබා

දෙනු ලැබේ. ලංසුපත් පිලිගැනිමෙන් පසු එම ටෙන්ඩර්කරුට ලිඛිත ව දන්වන අතර නියමිත දිනට හෝ එදිනට පෙර මුදලින් ගෙවිම කළ හැකිය. චෙක්පත් භාර ගනු නොලැබේ.

04. ලිඛිත ව දැන්වූ පසු ටෙන්ඩර්කරු නියමිත දිනට ගිවිසුම්ගත නොවුවහොත් ඊළඟ ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිරිනමනු ලැබේ.

05. ටෙන්ඩර් ආකෘතිපත් ලබා ගෙන ටෙන්ඩර් ඉදිරිපත් නොකරන හා ටෙන්ඩර් පිළිගෙන වහාම තැන්පත් මුදල් ගෙවා ගිවිසුම් අත්සන් කිරිමට අපොහොසත්වන ටෙන්ඩර්කරුවන්ට ස්වකිය ටෙන්ඩර් ඇප මුදල් ආපසු ලබා ගත නොහැක.

06. අවම ටෙන්ඩර් ගාස්තුවට අඩුවෙන් ලංසු මුදල සඳහන් කර ඇති හා අපැහැදිලි අකුරෙන් සම්පුර්ණ කර ඇති ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ටෙන්ඩර් ආකෘති පත්‍රයේ කරනු ලබන සෑම අළුත් කිරිමක්, කපා හැරිමක්, සංශෝධනයක් හෝ වෙනස් කිරිමක් තම කෙටි අත්සන යොදා ටෙන්ඩර්කරු විසින් සහතික කර තිබිය යුතුය.

08. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ ලිඛිත ව බලය ලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය.

09. ටෙන්ඩර් ලබා ගැනිම පිළිබඳ වැඩිදුර විස්තර සතියේ වැඩ කරන දිනවල මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය. (045-2287361)

10. ටෙන්ඩර් පිළිබඳ අවසාන තිරණය ප්‍රාදේශිය සභාව සතුය.

ඩී.ඒ.සී.රෝහිණී දසනායක,

ලේකම්,

ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව,

මොරහැල , බලංගොඩ

2023/08/29 දින ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවේ දී.

# උපලේඛනය

| අනු අංකය | විස්තරය | අවම ටෙන්ඩර් ගාස්තුව | ටෙන්ඩර් පෝරම ගාස්තුව (ආපසු නොගෙවන) | ටෙන්ඩර් ඇපතැන්පත් මුදල රු. (ආපසු ගෙවන) |
|---|---|---|---|---|
| 01 | බෙලිහුල්ඔය දියපහස ගිමන්හල දීර්ඝ කාලීනව බදුදීම | රු.32000.00 | රු.500.00 | රු.2,500.00 |